# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2092/14 – 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා – 2018.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු දින 10ක් ඉක්ම ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම් කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

**බාලගේ සාලිය සුමේධ ද සිල්වා,**
ඌව පළාතේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක,
ප්‍රවාහන, සංස්කෘතික, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍ය,
ඌව පළාත් සභාව,
බදුල්ල.

2018 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින,
ඌව පළාතේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක,
ප්‍රවාහන, සංස්කෘතික, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය,
ඌව පළාත් සභාව,
බදුල්ල, අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A – PG 4271 – 12 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඌව පළාතේ පළාත් සභාවේ මගී ප්‍රවාහන සේවා අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය

ඌව පළාත් සභාවේ වර්ෂ 2001 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පනවන ලද ප්‍රඥප්තියකි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ වර්ෂ 2018 අංක - දරන මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ පෙරවදන සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන, ඌව පළාත් සභාවේ වර්ෂ 2001 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ පෙරවදනෙහි ''මගී ප්‍රවාහන සේවා අධිකාරිය'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළවන කොටසෙහි මාතෘකාව සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි i කොටස ''ඌව පළාත සඳහා මගී ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවීම'' යන වචන වෙනුවට ''ඌව පළාත සඳහා මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියක් පිහිටුවීම'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ ''මගී ප්‍රවාහන සේවා අධිකාරිය'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (අ) වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (අ) වගන්තියේ ''සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන්'' යන වචන වෙනුවට ''සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන්'' යනුවෙන් ද, ''එයින් පස්දෙනෙකු නිලබලැති සාමාජිකයින් ද'' යන වචන වෙනුවට ''හය දෙනෙකු නිලබලැති සාමාජිකයින් ද'' යනුවෙන් ද ''හය දෙනෙකු පත්කළ සාමාජිකයන් ද'', යන වචන වෙනුවට ''හත් දෙනෙකු පත් කළ සාමාජිකයන් ද'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඇ) (1) (2) වගන්ති සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඇ)(1)(2) වගන්තිවල ''මගී ප්‍රවාහන'' යන වචන වෙනුවට ''ප්‍රවාහන'' වචනය ආදේශ කිරීමෙන් මෙම උපවගන්තිය සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඇ) (6) අලුත් උපවගන්තිය ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඇ)(5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තිය 6 (ඇ)(6) උපවගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

''6 (ඇ) (6) මෝටර් රථ පරීක්ෂක''

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (1) වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (1) වන වගන්තියේ ''පුද්ගලයන් තිදෙනෙකු'' යන වචන වෙනුවට ''පුද්ගලයන් දෙදෙනකු'' යන වචන ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (3) වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (3) වන වගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.

''ඌව පළාතේ ප්‍රවාහන සේවා අධිකාරියේ මාර්ග බලපත්‍ර හිමිකරුවන් අතුරින් දෙදෙනෙකු''

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) 4 (අ) (I) (II) උපවගන්ති සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (4) (අ) (I) (II) උපවගන්ති පරිච්ඡින්නකොට ඒ වෙනුවට පහත උපවගන්තිය ආදේශ කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6 (ඉ) (4) (අ) ලෙස බලපැවැත්විය යුතු ය.

''6 (ඉ) (4) (අ) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රාදේශීය නිලධාරියෙකු''

11. ප්‍රධාන ප්‍රඥප්තියේ ''අධිකාරියේ සාමාජිකයින් අතුරින්'' යන වචන වෙනුවට ''අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතුරින්'' යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියට ඉක්බිතිවම පහත අලුත් උපවගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11 (අ) උපවගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 (අ) අලුත් උප වගන්තිය ඇතුලත් කිරීම.

''11 (අ) පත්කල සාමාජිකයන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර තුනකට නොදන්වා නොපැමිණීම නිසා ධුර කාලය අවසන් වන්නේ ය.''

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (අ) උපවගන්තිය පරිච්ඡින්නකොට පහත උපවගන්තිය ඇතුලත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (අ) වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''උෟව පළාත ඇතුලත හා උෟව පළාත සම්බන්ධිතව මගී හා භාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හා පිළිගත හැකි ගුණත්වයකින් යුතු ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යමින් ඒ පිළිබඳ පරික්ෂාකාරී වීම, සමීක්ෂණය කිරීම සහ එම සේවාවන්ට අදළ ප්‍රමිතීන් නියම කිරීම''

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඇ) උපවගන්තිය පරිච්ඡින්න කොට පහත උපවගන්තිය ඇතුලත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඇ) වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''වෙන් වෙන් ගාස්තු මත මගී හා භාණ්ඩ ප්‍රවාහන සඳහා වාහනයක් යෙදවීමට කිසියම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට බලය දෙන අවසර පත්‍රයක් හෝ එවැනි වෙනත් අධිකාර පත්‍රයක් නිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම හා අවලංගු කිරීම පිළිබඳ රෙගුලාසි පැනවීම.''

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඈ) වැනි උපවගන්තියේ ''(3) වැනි උපවගන්තියේ'' යන වචන වෙනුවට ''(ඇ) උපවගන්තියේ'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඈ) වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඉ) උපවගන්තියේ ''මගී සේවා අවසරපත්‍ර ලාභියෙකු වන තැනැත්තෙකුට'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ අවසරපත්‍රලාභියෙකු වන තැනැත්තෙකුට'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඉ) වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඊ) උපවගන්තියේ ''මගී සේවා අවසරපත්‍රවලට'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ අවසරපත්‍රවලට'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඊ) වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (උ) උපවගන්තියේ ''මගී සේවා අවසරපත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස් රථයක'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක හෝ අධිකාර පත්‍රයක අධිකාරිය යටතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවයේ යොදවනු ලබන රථයක'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (උ) වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඌ) උපවගන්තියේ ''මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස් රථවල රියදුරන් සහ කොන්දොස්තරවරුන්'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් හෝ අධිකාරි පත්‍රයක් යටතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවයේ යොදවනු ලබන රථයක රියදුරන්, සහයකයින් සහ බස්රථවල කොන්දොස්තරවරුන්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඌ) වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (එ) (ඒ) උපවගන්තිවල ''මගී සේවා අවසර පත්‍රයක'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරි පත්‍රයක්'' යන වචන ආදේශ කිරීමෙන් එම උපවගන්තිය සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (එ) (ඒ) උපවගන්ති සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඔ) වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ඔ) උපවගන්තිය ඉවත් කොට පහත උපවගන්තිය ඇතුළත් කරනු ලැබේ.

''මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මාර්ගස්ථ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එකී අවසර පත්‍රයේ අධිකාරිය යටතේ මාර්ගස්ථ ප්‍රවාහනයේ යොදවනු ලබන රථයක රියදුරු, සහයකයින් සහ බස්රථ කොන්දෙස්තර ලෙස සේවයේ යොදවනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් සහ එම තැනැත්තාගේ සේවය ආරම්භ කිරීමේ හා නිම කිරීමේ වේලාවන් සම්බන්ධයෙන් ද තබාගත යුතු, පවත්වාගෙන යා යුතු හෝ අධිකාරියට ඉදිරිපත් කළ යුතු වාර්තා නියම කිරීම.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ණ) වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ණ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර එම උපවගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ණ) (i) හා 19 (ණ) (ii) උපවගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

''19 (ණ) (I) මාර්ගස්ථ ප්‍රවාහන සේවා රථ හිමියන්ගේ සංගම් ලියාපදිංචි කිරීම, දායකත්වය වර්ධනය කිරීම, රෙගුලාසි පැනවීම, ඒවාට මාර්ගෝපදේශකත්වය හා වෙනත් යෝග්‍ය යැයි සැළකෙන ආධාර, උපකාර, සේවාවන් හා සුබසාධන පහසුකම් ලබා දීමට විධිවිධාන යෙදීම.''

''19 (ණ) (II) මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන් පාලනය කිරීම, විධිමත් කිරීම, ගුණාත්මකභාවය දියුණු කිරීම උදෙසා සංගම් පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවාට අදාළව රෙගුලාසි පැනවීම, මාර්ගෝපදේශකත්වය හා වෙන යෝග්‍ය යැයි සැළකෙන සුභසාධන පහසුකම් ලබාදීමට විධිවිධාන යෙදීම.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ත) (ii) උප වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ත) ((ii) උප වගන්තියේ ''මගී ප්‍රවාහනයට'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවයට'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ත) (iii) උප වගන්තිය අලුතින් එකතු කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (ත) ((ii) උපවගන්තියට ඉක්බිතව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ත) ((iii) උප වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය.

''19 (ත) (iii) සියලුම මාර්ගස්ථ ප්‍රවාහන සේවා දායකයින් හා සේවාලාභීන්, අධිකාරියේ නිලධාරින් හා සේවකයින් පිළිබඳ ඇතිවන ආරවුල් බේරුම් කිරීම සඳහා බේරුම්කාර මණ්ඩලයක් පිහිටුවිය යුත්තේ ය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ද) උපවගන්තිය ප්‍රතියෝජනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ද) උපවගන්තිය ඉවත් කොට පහත උපවගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ද) (i) 19 (ද) (ii) උපවගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

''19 (ද) I මගී හා භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන රථවල සේවය කරන රියදුරන්, කොන්දොස්තරවරුන්ට හා රිය සහයකවරුන්ට අදාළව;

(1) සේවා අයිතිවාසිකම්,
(2) වෘත්තීමය කුසලතා පහසුකම් හා යෝග්‍යතාව,
(3) සේවයේ යෙදී සිටිය දී පිළිපැදිය යුතු විනය හා ආචාරශීලි බව; හා
(4) සේවයේ යෙදී සිටිය දී පැළඳිය යුතු නිල ඇඳුම්, ලාංඡන හෝ සංකේත විධිමත් කිරීම සඳහා රෙගුලාසි පැනවීම.

''19 (ද) III මාර්ගස්ථ ප්‍රවාහන සේවයේ යොදවන රථවල රියදුරන්, බස් කොන්දොස්තරවරුන් හා රිය සහයකයින් සඳහා වෘත්තීය පුහුණු ආයතනයක් අධිකාරිය විසින් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, සංවර්ධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ය) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ල) උපවගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 (ල) වගන්තිය අලුතින් එකතු කිරීම.

''19 (ල) මාර්ගස්ථ ප්‍රවාහන සේවා වෙනුවෙන් යොදවනු ලබන රථවල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම උදෙසා වාහන සේවා කිරීමේ ආයතන අධිකාරිය විසින් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම හා එම සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු නියම කිරීම හා රෙගුලාසි පැනවීම.''

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කරනු ලබන අතර එය ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රවාහන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය හා ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සමඟින් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 (1) උපවගන්තියේ ''ඉහත 22 ඡේදය'' යන වචන වෙනුවට ''ඉහත 21 ඡේදය'' යන වචන ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 (1) උපවගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 (අ) වගන්තියේ ''රුපියල් 2000 කට නොවැඩි දඩයක් හෝ අවුරුද්දකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට ඔහු යටත්විය යුතුය'' යන වචන වෙනුවට ''රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ සුළු වැඩ සහිත අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමක දඬුවමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ යටත්විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 (අ) වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 (ආ) වගන්තියේ ''රුපියල් 2000 කට නොවැඩි දඩයක් හෝ මාස 12 කට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ යටත්විය යුතුය.'' යන වචන වෙනුවට ''රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ සුළු වැඩ සහිත අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමක දඬුවමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ ඔහු යටත්විය යුතුය.'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 (ආ) වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''අධිකාරියේ අරමුදලට ලැබීම් ද, ඉන් මුදල් ගෙවීම් ද පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය හා මෙම මුදල් නිසි පරිදි පරිපාලනය කිරීම හා ගිණුම්ගත කිරීම පිළිබඳ වගකීම සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේ ය.''

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වැනි වගන්තියේ ''මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම'' යන වචන වෙනුවට ''මාර්ගස්ථ ප්‍රවාහන සේවා විධිමත් කිරීම'' යන වචන ආදේශ කිරීමෙන් ද ''බස් නැවතුම්පලවල්'' යන වචන වෙනුවට ''බස් නැවතුම්පලවල් හා රථගාල්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති මෙයින් ආදේශ කරනු ලබන අතර, එම උපවගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 36 (අ) සහ 36 (ආ) උපවගන්ති ලෙස බලපැවැත්විය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''36 (අ) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් මාසයේ ගිණුම් වාර්තා විමර්ශනයට ලක් කළ යුතු අතර, ඊළඟ මාසයේ අවසානයට පෙර අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

''36 (ආ) මුදල් වර්ෂය අවසන් වී ඊළඟ වර්ෂයේ මාර්තු තිස්එක් වන දිනට පෙර වාර්ෂික ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පරිච්ඡින්න කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත අලුත් උපවගන්තිය ආදේශ කරනු ලැබේ.

''මෙම ගිණුම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය මත රාජ්‍ය බැංකුවක එක් ගිණුමක් හෝ ගිණුම් කීපයක් පවත්වා ගෙන යා හැකි ය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම හා අලුතින් වගන්ති එකතු කිරීම.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 අර්ථ නිරූපණ වගන්ති යටතේ වූ පහත සඳහන් වගන්ති ඉවත්කොට ඒ වෙනුවට අලුත් වගන්ති එකතු කරනු ලැබේ.

''අධිකාරිය'' ''පළාත් අධිකාරිය'' යන වචනවලින් ''ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය අදහස් වන්නේ ය '' යන වචන වෙනුවට ''ඌව පළාතේ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය අදහස් වන්නේ ය'' යන වචන ආදේශ කරනු ලැබේ.

''අමාත්‍යාවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ මගී ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යාවරයා අදහස් වන්නේ ය'' යන වචනය වෙනුවට ''අමාත්‍යාවරයා'' යන්නෙන් ''ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යාවරයා අදහස් වන්නේ ය'' යන වචන ආදේශ කරනු ලැබේ.

''අවසර පත්‍රය'' ''මගී සේවා අවසර පත්‍රය'' ''මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර'' ''මාර්ග බලපත්‍ර'' යන නම්වලින් කුමන හෝ නමකින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ විවිධ ගාස්තු මත අවසර පත්‍රයේ දක්වා ඇති මාර්ග මගීන් ප්‍රවාහනය කිරීමට බස් රථයක් යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද මාර්ගස්ථ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් අදහස් වන්නේ ය'' යන වචන වෙනුවට ''කුමන හෝ නමකින් ප්‍රධාන ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ විවිධ ගාස්තු මත අවසර පත්‍රයේ දක්වා ඇති මාර්ග, මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා රථ යොදා ගැනීමට බලය දෙමින් නිකුත් කරන ලද මාර්ගස්ථ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් අදහස් වන්නේ ය.'' යන වචන ආදේශ කරන ලැබේ.

''ප්‍රවාහන අවසර පත්‍ර'' යන්නෙන් ''ඌව පළාත තුළ මගීන්, භාණ්ඩ හෝ වෙනත් ප්‍රවාහන සේවාවන් සඳහා දෙනු ලබන ලිඛිත අවසරපත්‍රය අදහස් වේ.

''මගීන්'' යන්නෙන් බස් රථ, ත්‍රිරෝද රථ, උද්‍යාන රථ, කාර්යාල සේවා, කර්මාන්ත සේවා, පාසල් සේවා හෝ වෙනත් රථවලින් ගාස්තු අයකර ප්‍රවාහනය කරන පුද්ගලයින්'' යනුවෙන් අදහස් වේ.

''භාණ්ඩ'' යන්නෙන් ''මගී නොවන කුලී පදනම හා ගාස්තු පදනම මත ප්‍රවාහනය කරන සියලු ද්‍රව්‍ය'' අදහස් වේ.

37. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

10 - 1237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.